සන්නස 10
ගමන බෝ දිගය ඒ නමුදු යා යුතුයි
ගිමන නිම නොවන තරමටම බෝ දැඩියි
සෙවණ සදන හිතමිතුරු සංහිඳ අගෙයි
පවන සේ නුඹේ සෙනෙහස දැන් දැනෙයි

සන්නස දස අවුරුදු සැමරුම

සන්නස යන නාමය මෙල්බන් නුවර ද ඕස්ට්‍රේලියාව පුරා සහ ලෝකයේ ව්‍යාප්ත වූ සාර්ථක සඟරාවක් බවට පත්ව තිබෙන බව කිව යුතුයැයි මා සිතමි.

විවිධ පුවත් පත් නිර්මාණ සඟරා බිම් වුවත් එම සඟරා සහ පුවත් පත්වලට නිශ්චිත වූ අනන්‍යතාවක් නොමැති බැවින් සන්නස තම අනන්‍යතාව නිර්මාණය කරගෙන සිටිතැයි මට සිතේ.

දේශපාලනයක් නොමැති මිනිසෙකු ජීවත් වීම ආශ්චර්යයක් යැයි මට සිතේ. මිනිසෙකුගේ ජීවිතයේ සෑම මස්වැදැල්ලක්ම ආවරණය වී ඇත්තේ දේශපාලනය නැමැති සංවේදී මාතෘකාවෙනි. ගවේශනය විශ්ලේශනය විචාරය නැමැති සංකල්ප වලින් නිම වෙන ලිපියක් සංවාදීම හෝ විසංවාදීම විචාර කරන්නට පාඨකයාට පුළුවන. එය සන්නස දස අවුරුද්ද පුරාවට නිර්මාණය කලෙමු. විචාර විවේචන තුලින් ඉදිරියට ගිය සන්නස ජගත් ජේ. එදිරිසිංහ අසෝක සුභසිංහ ශ්‍රීනාත් මද්දුම නොසිටින්නට අද කුමන දිසාවකට කුමන තැනකට තල්ලුවේදැයි සිතා ගැනීමට පවා අසීරුය

අසෝක මා ආනන්ද එකතු වී ජගත් ජේ. එදිරිසිංහ මහත්මා සමග මෙම පුවත් පත නිර්මාණ නොකලානම් අද ඔස්ට්‍රේලියාවට, ලෝකයට විචාරාත්මක දේශපාලන කලාවක්, කලා සංස්කෘතියත් මිනිස්කමත් මනුස්සකමක් අසාධාරණයක් අපේක්ෂක් ගැන කතා කරන්න වේදිකාවක් නිර්මාණය නොවන්න ඉඩ තිබුණි.

සන්සන ඔබට ජය වේවා. විචාරාත්මක චින්තන කලාව තව තවත් වර්ධනය වේවා !

සාලිය ගලප්පත්ති

මෙල්බරන් පුරවරයේ ලාංකීය සලකුණ සනිටුහන් කරමින් දෙස් විදෙස් තතු ඇසිල්ලකින් පුවත්පත් පිටු මත සනිටුහන් කරමින් මුද්‍රති මාධ්‍යයේ ප්‍රබලත්වය මිලිනවන්නට නොදී රැකගන්නා සන්නසට.....

මෙල්බන් කලා කෙතට නිරතුරුව දොරටු විවර කරමින් සහෘද කලාකරුවන්ගේ සෞන්දර්යාත්මක නිර්මාණ පොදු බවට පත් කරනු වස් තවත් බොහෝ දෙනෙත් අභියසට නිරුතුරුවම රැගෙන යන

සන්නසට.....

දස වස් සපිරෙන මේ මොහොතේ දියුණුවේ රුවන් දොරටු තව තවත් විවර වන්නට සුභාශිංෂණ.....

අමා සිරිවර්ධන

සුබ පැතුම්

ළං කෙරුමට අප තුල හෙළ	ආරය
පන් හිඳ වෙද දී යුතුකම	බාරය
සන්සුන් ගමනක යන	ආකාරය
සන්නස වෙනුවෙනි මේ	උපහාරය
දෙස බස රැස වෙත සෙනෙහස	ගාවා
කස පහරක බග මහිමය	පෑවා
රස ගඟුලක සරසවි හිඳ	වූවා
දස වසරට පියවර මැන	ආවා
අන්තර් ජාලය තුල නව	පිටුවක්
ලක් අබිමානය පවසන	දසුනක්
කැන්ගරු බිම සිප ගෙන එන	සුවඳක්
සන්නස වෙත සිරි සුබ නව	වසරක්

ජගත් වෙත්තසිංහ

'සන්නස' දැක්මක් ඇති පත්තරයක් !

ආගමික, ක්‍රීඩා, කාන්ත, ළමා ආදී විශේෂාංග පත්තර නොවන ඒවා පාඨකයා වෙත ප්‍රවෘත්ති සහ මත ගෙන එයි. එහිදී එම පුවත්පතේ මාධ්‍යවේදීන්ගේ දැක්ම ඉතා වැදගත් වන්නේ එය සමාජයේ යහපත උදෙසා කොතෙක් දුරට දායක වන්නේද යන්න තහවුරු කරන බැවිනි.

ලංකාවේදී නම් 'ඇත්ත' - කොමියුනිස්ට් පක්ෂයේ නිල පුවත්පත වෙයි.
'සියරට' - එක්සත් ජාතික පක්ෂයේය.
'දිනකර'/ 'සිරිලක' - ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේය.
'නියමුවා' - ජනතා විමුක්ති පෙරමුණේය.

මෙවැනි පූර්ව හැඳින්වීමක් සමග එම පුවත්පත අතට ගන්නේ එම පාක්ෂිකයන්ය. එසේත් නැත්නම් විරුද්ධ මත දැරීමට ශක්තියක් ඇත්තෝය. ඉන් අදහස් කරන්නේ මාධ්‍යවේදීයා සමාජයේ පෙරටුගාමීන් හෝ මග පෙන්වන්නන් ලෙසින් තත් කාලීන සමාජයේ සිදුවන දෑ පිළිබඳ පාඨකයාට නිවැරදි මතයක් ඉදිරිපත් කරන බවයි.

එහෙත් ව්‍යාපාරික හා මාධ්‍ය අර්ථපතීත්වය තුල මෙය සරල, පහසු කාර්යයක් නොවේ. රජයේ මාධ්‍ය ආණ්ඩුවට කඩේ යන බනට චෝ දනා නැගෙන්නේ මෙනිසාවෙනි. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව වැනි කුඩා පරිමාණ ව්‍යාපාරිකයන් මාධ්‍ය අර්ථපතීත්වය දරද්දී ඔවුහු පවතින රජය විවේචනයට මැලි වෙති. ඒ ලැබෙන දැන්වීම් වල බලයෙනි. ආණ්ඩුවද ඒ බලහත්කාරීත්වය ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යයි. මෙය ධනවත් රටවලදී වෙනස් වන්නේ යොදවන ප්‍රාග්ධනයේ විශාලත්වය මතයි. මීට අමතරව ප්‍රායෝගිකව මාධ්‍යකරුවන්ගේ ඇති දීනත්වය හා වෘත්තීමය නොවන බවද මධ්‍ය දැක්ම හා සත්‍ය කතා කිරීමට මැලි කරවයි.

නමුත් විදේශයකදී පළ නොකරන වාර්ගික පුවතක් අසීමිත නිදහසක් අත්විඳියි. ඒ ඔවුන්ව නිගමනයට කිසිවෙකුත් නැති බැවිනි. එහෙත් ඉන් ප්‍රායෝජනයක් ගන්නේ කී දෙනාද ?

ඕස්ට්‍රේලියාවේ පළ කෙරෙන සිංහල පුවත්පත්වලට තවමත් ජාත්‍යන්තර මට්ටමේ ආයෝජන කිසිවක් ලැබී නැත. ඒ හේතුවෙන් මාධ්‍යකරුවන් මුදලට ගැනීමක් සිදුවන්නේ ද නැත. එය කොතරම් ආශ්වාද ජනක දෙයක්ද ? කිසිදු බලපෑමකින් තොරව තමන්ට හිතෙන, නිවැරදි යයි විශ්වාස කරන සමාජයට යහමග පෙන්වන දෑ ලිවිය නොහැකි ද ? එහිලා 'සන්නස' ඉටු කරන්නේ ඒ අවස්ථාව ප්‍රයෝජනයට ගැනීමයි.

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධ 'ඇත්ත' පුවත්පතේ / සේවය කළ අන්ත දක්ෂිනාංශික මාධ්‍යවේදීහුද සේවය කළහ. එහෙත් ඔවුන් අනුගමනය කළේ පුවත්පතේ දැක්මයි. එය තමන්ගේ පෞද්ගලිකත්වය අභිබවා යන සමාජ යහපත වෙනුවෙන්මය.

'සන්සන'ට දායක වන්නන් තුළ විවිධ මතවාද තිබිය හැක. නමුත් ඔවුන් පාඨකයා වෙත එන විට ඒකමිතියක් ඇත. ඉන් අදහස් කරන්නේ ඔවුන්ගේ නිදහස් අදහස් වලට ඉඩක් නැති බව නොවේ. ඔවුන් සියලු දෙනා පෙළ ගැසෙන්නේ එකම අරමුණක් වෙනුවෙනි. ඒ සමාජ යහපතකි. ඒස දහා ඔවුනට දැක්ම තිබිය යුතු වන්නේමය.

ලියන දේවලට පමණක් නොව 'සන්නස' ඉදිරිපත් කිරිමෙන්ද, භාෂාව හැසිරවීමෙන්ද දැක්මක් ඇති අය බව කිව මනාය. එවැනි පත්තරයක් කියැවීමට පාඨකයන් ලොල් වඩති. ලංකාවෙත් කඩදාසියේ මුද්‍රණය කළ පත්තර එද්දීත්, අන්තර්ජාලයෙන් පත්තර ඇසට ගසද්දීත් අප ඇයි 'සන්සන' කියවන්නේ ?

'සන්සන' පුවත් පතේ නොරිස්සුම් ලිපියක් පළ වූ විට තර්ජනය කරන්නේ ඇයි ?

ඒ 'සන්නස' ට දැක්මක් ඇති බැවිනි.

මාධ්‍යයක් නම් හරි හෝ වැරදි දැක්මක් තිබිය යුතුය.

ඔස්ට්‍රේලියාවේ ප්‍රධාන මාධ්‍ය ආයතන මැතිවරණ වලට පෙරාතුව ඔවුන් සහය දක්වන පක්ෂය නම් කරයි.

ඉන් අදහස් කරන්නේ ඒ පක්ෂයේ ආධාරකරුවන් වීම හෝ බලයට පත්වීමෙන් පසු ඒ ආණ්ඩුවේ තනතුරු දැන්වීම් ලබා ගැනීම නොවේ.

එය දියුණු මාධ්‍ය භාවිතයේ ආබ්‍යාතයයි.

එවැනි ගමනක් යන 'සන්නස' ට සුභ පතමි.

චරිත දිසානායක

සන්නස සන්නසක් ලෙසම තිබිය යුතුද?

සන්නස කියන්නේ වැදගත් එකක්. ඒ නිසාම යමක් සන්නසේ සටහන් කරන්න මා අදහස් කළා. මම සටහන් තබන සන්නස දැන් අවුරුදු දහයක් පරනයි. සන්නස පැරණි වූ තරමට වටිනාකමත් වැඩියි. ඒ නිසා ද යමක් සටහන් කිරීම වටිනව.

සොයා සපයා යමක් ඉදිරිපත් කිරීම පුවත්පතේ කාර්ය භාරය වන අතර කියවා බැලීම දැන තේරුම් ගැනීම රස විඳීම හා විවේචනය පාඨක අපගේ කාර්යභාරයයි. සන්නස වූ කලී සංනිවේ දනාත්මක විචාදාත්මක විචාරාත්මක සංග්‍රහයකි. අර්ථාන්විත ලිපි ලේඛන වලින් හැඩ ගැන්වූ සන්නස දස වසරක් පුරා මසක් පාසාම ඕස්ට්‍රේලියා මහද්වීපය සිසාරා සැරිසරමින් පාඨක සමූහයා ආකර්ෂණය කරගත් බව අපි දනිමු.

නොබියව නොසැලි දිග ගමනක යෙදී ඇති බැවින් සන්නස සන්නසකින් වන කාර්යය සිද්ධියට ද ඉදිරියෙන් සිටී. ප්‍රඥාවන්ත වූ හා සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීමේ කාර්යයට ඉදිරි දස වසරේ ද සන්නසට ශක්තිය නොඅඩුව ලැබේවායි මෙත් සිතින් ආශිංසනය කරමි.

ඩැංඩිනොන් ධම්මදීප භාවනා මධ්‍යස්ථානය
ශාස්ත්‍රපති පූජ්‍ය අකරවිට සංඝානන්ද

සන්නසට සන්නසක්

විශ්ව කෝශයක් බඳු
අපේ සන්නස.... වනාහී
සූර්ය වංශෝත්ත්දත
ත්‍රි සිංහලාධීශ්වර
නව රත්නාධිපති .... බාහු
චක්‍රවර්තීන් වහන්සේ
කෙනෙකුන් විසින්
දෙවා වදාරන ලද එකක් නොව
අපේ ම ඇත්තන් විසින්
එලි දක්වනු ලබන
රසාවලියක් වේ

ඒ සන්නසට ම විසින්
අපේ දරු මුනුබුරු
පරම්පරාව පවතිනා තුරු
ප්‍රවේනි සැලැස්මට
පවතනා සැටියට

මේ "සන්නස"
දෙවා වදාල පනතයි

වි.ක. ධර්මබන්ධු

'සන්නස' රටින් රට පණිවිඩ රැගෙන එයි. රජ පුවත්, ආගමික පුවත්, බොදු පුවත්, යුධ පුවත් සමග සාහිත්‍ය කලා දැනුමත් මගින් සහෘදයාට විචාරශීලී ඥානය ලබා දෙයි. 'සන්නස' සන්නස්කරුවන් කණ්ඩායමකි. වසර දහයක ගමන දිග ය. වෙහෙසකර ය. එහෙත් අභිමානවත් ය. කැපවීමත්, උත්සාහයත්, ප්‍රයත්නයත් එක සේ දුෂ්කර ය. අප අගයන්නේ ඔබේ ඒ ප්‍රයත්නය යි.

ජය ශ්‍රී චන්ද්‍රජිත්

දයාබර "සන්නස"

පා පොඩි බිම ගසා නැගිටීමට වෙර දරන ළදරු කාලයේ වුවත් ඔබ පෙන්වූයේ වයසට වඩා මුහුකුරා ගිය ස්වාභවයක්..... ඔබ වටා සිටි දෙගුරුනු සහ ඔබට මග පෙන්වූවන් සතු අභාසය ඔබට ලැබෙන්න ඇති..... ඉතින් එහෙමනම් එය අරුමයක්ද ?

ඔබ දැන් කරදඬු උස්වී මදක් හිතුවක්කාර වන වයසට ඇවිත්..... එනමුදු හිතුවක්කාර කම හරහා මතුවන යොවුන් බවේ හිතුවක්කාරී නිර්මාණශීලීත්වයෙන් ඔබ සැරසේවී, හැඩවේවී..... කාටද ආඩම්බර ? කවුරුත් අසාවි,

වසර 10 ක් පුරා ඔබව රැගෙන ආ මාවතේ විසිරි දහදිය පිනි කඳුළු, වැනුම් සහ බැනුම් හමුවේ මුවින් නොබිනූ වදන්, ගලින් සහ මලින් සැදී ප්‍රතිචාර, මේ ඈ හමුවේ දර දිය ඇදි සියල්ලන් ආඩම්බර වේවී අද දින ඔබ ගැන දයාබර " සන්නස".....

විශ්ව ගම්මානයේ බොහෝ දෑ ඇතැඹුලක් කොට ගෙන හරැති, බරැති අරුතැති නේක විලාසිනියෙන් මාසිකව අප හමුවට එන ඔබව කියවා වින්දෙමි අනේකවර.... ඇත්තටම ඔබ පණ්ඩිතයි, ආඩම්බරයි ඒ ගැන. දස වසක් නොව ශත සහස් වසක් පාඨක මනසේ රජයන්නට ඔබට ආයුබෝ වේවා..... !!!

දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය
විධායක නිශ්පාදිකා සහ සිංහල වැඩසටහන් අංශ ප්‍රධානී,